ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2008/2009

නීති ක්‍රම - **LWU 1412**

කාලය - විනාඩි 40

---

දිනය - 2008.09.30 වේලාව - පෙ.ව. 11.00 - පෙ.ව. 11.40 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. "නෛතික ක්‍රියාවලියේ මටසිලුටුවූ ක්‍රියාකාරිත්වය සඳහා නෛතික ලේඛනයන්ට ඇති ප්‍රවේශය විශාල ලෙස වැදගත් වන බැවින් එවන් ලේඛනයන්ට ඇති ප්‍රවේශය ප්‍රමාණවත් නොවීම ශ්‍රී ලංකාවේ මෙම නෛතික ක්‍රියාවලිය කෙරෙහි අනර්ථකාරී ලෙස බලපා ඇත."

සුදුසු උදාහරණ මගින් ඔබේ පිළිතුර සනාථ කරමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

02. 'හොලෝ වුඩ්' දේශය එහි චිත්‍රපටවලට විශේෂයෙන්ම ක්‍රියාදාම චිත්‍රපට සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියක් උසුලයි. එම දේශයේ බොහෝ අද්විතීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිලි , පහරදීම් හා වෙඩි තැබීම් පිළිබඳ දර්ශන පටිගත කිරීම සඳහා යොදා ගන්නා අතර , එමගින් ගොඩනැගිලි විශාල ප්‍රමාණයකට අලාභ හානි සිදුවේ.

'හොලෝ වුඩ්' හි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල අද්විතීය ඓතිහාසික හා වාස්තු විද්‍යාත්මක වටිනාකමක් සහිත ජාතික උරුමයක් වන අතර වසර පුරාම නරඹන්නන් සංචාරය කරන ස්ථානයකි. මේ අනුව එය හෝ ඊට සමාන ගොඩනැගිලිවලට චිත්‍රපට කරුවන්ගෙන් සිදුවන හානි වලින් ආරක්ෂා කිරීමට 'හොලෝ වුඩ්' හි පාර්ලිමේන්තුව ඓතිහාසික ස්ථාන ආරක්ෂා කිරීමේ පනත පනවන ලදී. එම පනතේ 10 වන වගන්තියෙන් දැක්වෙන්නේ පාර්ලිමේන්තුව ද ඇතුළුව, ඓතිහාසික ගොඩනැගිලි ලෙස ලැයිස්තු ගත කර ඇති ගොඩනැගිලි වලට චිත්‍රපට නළු නිළියන්ට හෝ කැමරාකරුවන්ට ඇතුළු විය හැක්කේ සිරිනැරඹීමේ කටයුතු සඳහා පමණි යනුවෙනි .

හොට්ෂොට් යනු ක්‍රියාදාම චිත්‍රපට වල රගපාන ප්‍රසිද්ධ නළුවෙකි. ඔහු තම දර්ශනවලදී නිරන්තරයෙන්ම ගොඩනැගිලි වලට හානි පමුනුවන පුද්ගලයෙක් බවට ප්‍රකටය. මෑතකදී හොලෝ වුඩ්හි පාර්ලිමේන්තුවට තේරී පත්වූ ඔහු පාර්ලිමේන්තුවේ ආරම්භක සැසිවාරයට තමාගේ නවතම චිත්‍රපටයේ වීරයාගේ ඇදුමින් සැරසී එම කටයුත්ත වීඩියෝ ගත කිරීම සඳහා කැමරාකරුවන් රැසක්ද සමග පැමිණියේ ය.

හොට්ෂොට් හා කැමරාකරුවන් පාර්ලිමේන්තුවට ඇතුල්වීම වැලැක්විය යුතුද යන්න පිළිබඳව පාර්ලිමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් හට අදහසක් නොමැති අතර ඒ පිළිබඳව ඔබේ උපදෙස් පතයි. හොලෝ වුඩ් හි අර්ථ නිරූපන නීතීන් ශ්‍රී ලංකාවේ එම නීතියට සමාන බව උපකල්පනය කරමින් ආරක්ෂක නිලධාරීන්ට උපදෙස් දෙන්න. සුදුසු නඩු තීරණ මගින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

- හිමිකම් ඇවිරිණි. -